


ජගත් ජේ එදිරිසිංහ ලියන

# ගිම්හාන සුළඟ

13

**මෙතෙක් කතාව**

උසස් අධ්‍යාපනය සඳහා ඔස්ට්‍රේලියාවට එන මට විශ්ව විද්‍යාලයයේදී ගුරුසිංහ ඇමතිවරයාගේ පුතා වන අශේන් හමුවෙයි. අන්තර්ජාලයේදී මට හමුවන විශ්වත් මා ඔස්ට්‍රේලියාවේ නැවතී සිටින මාමාගේ පුතා වන සුනෙත් අයියාත් මගේ දිවියේදී මා හා සමාන්තරව යමින් සිටියි. අම්මා සිය දෙවන විවාහයේ සැමියා වන ජයසිරි අංකල් සමග ඔස්ට්‍රේලියාවට එන්නේ මේ අතරේදීය. ජයසිරි අංකල් අශේන්ගේ ඥාතියෙකි. තාත්තා ගුරුසිංහ ඇමතිට එරෙහිව ඡන්ද ව්‍යාපාරයට එන්නට උත්සාහ කරයි. වසරාවසාන නිවාඩුවේදී අප ගිය විනෝද සවාරිය මසිතට තවත් බරක් එක කළේය. නන්දා සහ ජයසිරි අංකල් එදා හැසිරුණේ මසිතේ යම් සැකයක් ඇති වන පරිදි ය. සුනෙත් අයියා නිවසෙන් යන්නට ගියේ මේ කාරණය නිසාම යයි මට සිතෙයි. විශ්ව තමා විවාහ වූ බව හදිසියේම දවසක කියයි. සුනෙත් අයියා අමන්දා නම් තරුණිය හා හිතුවක්කාර ලෙස විවාහ වූ බව ඇසූ මාමා කෝප විය. නන්දාගේ අනියම් සම්බන්ධය පිළිබඳව මෙතෙක් කල් නිශ්ශබ්දව සිටි මාමා ඇ සමග කලහ කරගෙන නිවසින් පිටව ගියේ ය. මාමා අනතුරකට ලක්වූ පුවත එදා සවස අපි දැන ගත්තෙමු.

මාමාගේ මරණය අධික ලෙස බීමත්ව රිය පැදවීමෙන් සිදුවූ අනතුරක් නිසා සිදුවිනැයි පොත් පත් වල ලියැවෙන්නට ඇත. සැවොම එය විශ්වාස කරන්නටත් ඇත. සිදුවූ සත්‍ය සිදුවීම් මාලාව ලෝකයට රහසක්ව වැළලී යනු ඇති බව මට සහතික ය.

-කාරෙක කුඩු වෙලා" යම් කිසිවකු කියනු මට ඇසුණි. ඒ අනතුරේ විස්තර අසන්නට මට අවශ්‍ය නැත. මම මිනිසුන් වෙතින් පලා යමි. කොතැනක හෝ සැඟව සිටින්නට මට අවශ්‍යව ඇත.

මම අවමංගල්‍ය ශාලාවේ මෙකෙළවර සිට ඇති තරම් හැඬුවෙමි. මාමාගේ නිසල දේහය අසළට ගොස් එදෙස බලන්නට තරම් මට ශක්තියක් නොවී ය. ඈත අතීතයේ සුනෙත් අයියා එක් පසෙකිනුත් මා අනෙක් පසිනුත් තුරුළු කරගෙන මාමා දෙඩූ වදන් මගේ සිහියට නැගෙයි. අප දෙදෙනා දෙපසින් හිඳුවාගෙන බත් කැවූ සැටි මට සිහිපත් වෙයි. ඒ සියල්ල සිහිපත් වන විට වාවාගත නොහැකි දුකකින් මසිත පිරී යයි.

දුවක නැති මාමා ට මා දුවක වූ බව මම දැන සිටියෙමි. මා තමාගේම දුවක කර ගන්නට සියුම් බලාපොරොත්තුවක් ඔහුගේ සිතේ කෙළවර තිබූ බවද මම දැන සිටියෙමි. සියල්ල සිදුවන්නේ අපට අවශ්‍ය වන ආකාරයට නොව වෙනත් කොතැනක හෝ ලියැවී ඇති යම් කිසි නියමයකට අනුව බව මම දැන් සිතමි. අපි රූකඩ සේ මේ වේදිකාවේ පෙනී සිටිමින් කාලය ගෙවා දමන බව මම වටහා ගෙන සිටියෙමි.

සුනෙත් අයියාත් ඔහුගේ යහළුවනුත් මරණයේ කටයුතු නිසි පරිදි සංවිධානය කළ බවක් මට යන්තමින් මෙන් මතක ය. අමන්දා ද එහි ප්‍රධාන චරිතයක් ව සිටියා ය. අශේන් වරින් වර පැමිණ ගිය නමුදු මම ඔහුට මුහුණ දී කතා කරන්නට නොගියෙමි. ඔහු ද මා සමග දොඩන්නට විශේෂ උත්සාහයක් නොගත් බව මට වැටහුණි. එය මට මහත් සහනයක් විය.

මේ ව්‍යසනය හමුවේ ජයසිරි අංකල් හැසිරුණේ කිසිවක් නොදන්නා පුද්ගලයකු ලෙස යයි මට සිතෙයි. ඔහු සුනෙත් අයියා සමගින් මරණයේ කටයුතු සංවිධානය කළේ ශූර සංවිධායකයකු ලෙසය. ගුරුසිංහ නම් ඇමතිවරයාගේ ලේකම් වරයාව සිට වගකීම් දරා සංවිධාන කටයුතු කිරීමේ මනා පළපුරුද්දක් තමාට ඇති බව ඔහු මනාව පෙන්වා දුන්නේ ය.

මම මේ සියල්ලේ දී ප්‍රේක්ෂකයකු පමණක් වූයෙමි. එතැනින් ඔබ්බට සිතා මතා යමක් කරන්නට ශක්තියක් මට නොවීය. මට අවශ්‍ය වූයේ මාමා වෙනුවෙන් ඇති තරම් හඬා වැටීමට පමණකි. අම්මාත් තාත්තාත් හැරුණ විට මට ළඟින්ම සිටි නෑයා මාමා විය. ඔහුගේ වියෝව මට සිහිනයක් සේ දැනෙයි. මෙය මරණයක් නොව මිහිමැරුමකැයි කෑ ගසා කියන්නට මට අවශ්‍ය විය.

-උඹලා මගේ මාමා මරාගත්තා" යි ජයසිරි අංකල්ගේ මුහුණට කෑ ගසා කියන්නට මට අවශ්‍ය විය.

මට කාට හෝ කතා කර මගේ දුක කියන්නට අවශ්‍ය විය. මා තනි වී ඇති බවක් මට දැනෙයි. කීප වතාවක් උත්සාහ කළත් තාත්තා දුරකථනයට සම්බන්ධ කරගන්නට මම අපොහොසත් වූයෙමි.

-මහත්තයව අල්ලගන්න දැන් ලේසි නෑ බේබි" යි සිරිසේන මාමා මට කීප වතාවක්ම කීවේ ය. තාත්තාගේ ලේකම්වරිය වූ විසාකාගෙන් තාත්තා පණිවුඩය ලබා ගන්නට ඇත. ඔහු නැන්දාට කතා කර විස්තර විමසූ බව මම පසුව දැන ගත්තෙමි.

මාමාගේ මරණයෙන් පසු දින කීපයක් සුනෙත් අයියා හා අමන්දා නිවසේ නතරව සිටියහ. හත් දවසේ දානයේ කටයුතු කෙරුණේ ද ඔවුන් සිටියදී මය.

-පුතා දැන් වත් ගෙදර නවතින්න...." නැන්දා වරෙක ඔහුට කියනු මම අසා සිටියෙමි. ඔහු කිසිදු පිළිතුරක් නොදුන්නේ ය. මේ මුළු කාලය පුරා ඔහු නැන්දාට හරියාකාරව මුහුණ දී කතා නොකළේ යයි මට දැනෙයි.

-අයියා.. ඔයා අමන්දා එක්ක ඇවිත් මේ ගෙදර නවතින්න.." මම ඔහු තනිව මුණ ගැසුණ විටෙක කීවෙමි.

-බැහැ නංගි.." ඔහු ක්ෂණිකව කීවේ ය. ".. මට ආපහු මේ ගෙදරට එන්න බැහැ."

-ඇයි.. මේක ඔයාගෙ ගෙදරනෙ.."

**මට හිතවත්ව වචනයක් දොඩන්නට වත් අවසානයේ මා අසළ රැඳුනේ මා සැම විටම ප්‍රතික්ෂේප කළ මේ හිතුවක්කාර තරුණයා පමණක් නොවේදැ යි මම සිතුවෙමි.**



ඔහු කිසිවක් නොකියා මදෙස බලා සිටියේ ය. ඔහුගේ දෑස කෙළවර සිහින් කඳුළු බිඳුවක් නැගුණි. ඔහු වහා ඉවත්ව ගියේ ඒ කඳුළ මගෙන් සඟවා ගන්නට විය යුතු ය.

-මං යන්නම් කෙෂි...." සියළු අමුත්තන් නික්ම ගිය පසු අශේන් මා සොයා පැමිණ කීවේ ය.

"... දුක් වෙන්න එපා දැන්.. ජීවිතේ හැටි ඔහොම තමයි..."

-ආවාට ස්තූතියි.." මම යන්තම් වචන දෙකක් ගැට ගසා ගත්තෙමි.

-මොකක් හරි ඕනෙ කමක් වුණොත් මට කතා කරන්න.." ඔහු කීවේ ය.

-තෑන්ක්ස්..."

ඔහු ටික වේලාවක් මදෙස බලා සිටියේ ය. තවත් මොනවා හෝ කියන්නට ඔහුට ඕනෑ ව තිබෙන්නට ඇත. මගෙන් අනුබලයක් නොලද හෙයින්දෝ ඔහු ආපසු හැරුණේ ය. මොහොතක් නැවතී යමක් සිහිපත් වූ කලෙක මෙන් යළි මවෙත ආවේ ය. මගේ දෙවුරහිසෙන් අල්ලා ගත් අශේන් ටික වේලාවක් මගේ දෙනෙතට එබී බලාත්වන ම සිටියේ ය.

-කෙෂි... කිසි දේකට කණගාටු වෙන්න එපා..." ඔහු මිමිණුවේ ය.

මම හිස සැළුවෙමි. ඒ ඔව් කියන අර්ථයෙන් ද නැත්නම් නෑ කියන අර්ථයෙන් ද කියන්නට මම ම නොදැන සිටියෙමි..

ඔහු සුසුමක් හෙළුවේ ය. ඉන්පසු සෙමින් මගේ උරහිසට තට්ටු කර නිහඬවම යන්නට ගියේ ය.

මට හිතවත්ව වචනයක් දොඩන්නට වත් අවසානයේ මා අසළ රැඳුනේ මා සැම විටම ප්‍රතික්ෂේප කළ මේ හිතුවක්කාර තරුණයා පමණක් නොවේදැ යි මම සිතුවෙමි.

සියල්ලන් නික්ම ගිය පසු නැවත නිවස තුළ පාළුව අරක් ගත්තේ ය. මම ඒ පාළුව මැද මගේ දින චරියාව නැවත නිසි මඟට ගන්නට උත්සාහ ගනිමින් සිටියෙමි. අම්මාත් නැන්දාත් තුෂ්නිම්භූත වූ කලෙක මෙන් නිහඬ ව්‍රතයක වෙළී සිටිති. දින කීපයක් ගත වන තෙක් ජයසිරි අංකල් නිහඬව සිටියද දැන් ඔහු ද ක්‍රමයෙන් සිය සුපුරුදු කෙළිලොල් බව ප්‍රදර්ශණය කරන්නට පටන් ගෙන ඇත . මේ සියල්ලට ම වගකිව යුතු පුද්ගලයා තමා බව ඔහු නොදන්නා සේ ය. මාමා ඔහු කෙරෙහි දැක්වූ නොපහන් බව ඔහු සැබැවින්ම නොදැන සිටින්නට ද ඇතැයි මට වරෙක සිතෙයි. මාමා ඒ තරමටම සිය සිතුම් වසංගාගෙන සිටි බව මම දනිමි.

අවසාන විභාග අත ළඟ එයි. එනිසා ම විශ්ව විද්‍යාලයට යාම නිසි පරිදි කළ යුතු විය. අතපසු වූ පාඩම් ආවරණය කරගන්නට මට මහත් වෙහෙසක් දරන්නට විය. උදව්වට කිසිවකු නොසිටිය ද මම මහත් වෑයමින් සියල්ල එක්තැන් කර ගත්තෙමි.

කල් ඇතිව නිවසට එන පුරුද්ද මම ඉවත් කර ගත්තෙමි. සවස වන තුරුම නැත්නම් රෑ බෝ වන තුරුම විද්‍යාගාර තුළ ගත කරන්නට මම පුරුදු වුණෙමි. මගේ වැඩ එකලස් කරගන්නටත් නිවසේ අප්‍රසන්න පරිසරයෙන් මිදෙන්නටත් මට ඒ නිසා හැකි ව තිබුණි.

තාත්තාට කතා කිරීමේ අවසරය ද දැන් දැන් මගෙන් ගිලිහීමින් තිබෙයි. ලංකාවට කතා කරන කිසි විටෙක ඔහු නිවසේ නැත. ජංගම දුරකථනයට කතා කළ ද බොහෝ විට එය අවහිර ව තිබෙන්නේ ඔහුගේ කාර්ය බහුල බව ප්‍රදර්ශණය කරමිනි. තාත්තා පිළිබඳ තොරතුරු මා දැනගත්තේ එක්කෝ සිරිසේන මාමා ගෙනි නැත්නම් විසාකා ගෙනි.

තාත්තා පාර්ලිමේන්තුවේ දී මහත් ආන්දෝලනාත්මක කතාවක් කළ බව මා දැන ගත්තේ අන්තර්ජාලයේ පුවත් පත් මගිනි.

ගුරුසිංහ මන්ත්‍රීවරයා ඇතුළු පිරිසක් විසින් අයථා ලෙස උපයාගත් වත්කම් පිළිබඳ හෙළිදරව් කිරීම පුවත් පත් වල මුල් පිටු වලට මහත් සැනසිල්ලක් ගෙන දුන් ප්‍රවෘත්තියක් වූ බව නිසැක ය. සැවොම තාත්තා වීරයකු ලෙස සලකන්නට ඔහු පසසන්නට ඇත. කිසිවකු කරන්නට පසුබට වන භයානක ක්‍රියාවක් ඔහු කර ඇති බව තේරුම් යන සෑම මොහොතකම මගේ ඇඟ ශිරිගඬු පිපී යයි. තාත්තා ගේ ආරක්ෂාව පිළිබඳ මහත් බියකින් මසිත පිරෙයි. ඔහු පිළිබඳ මෙලෙස සිතන්නට මෙලොව සිටින එකම පුද්ගලයා මා පමණක් වන්නට ඇතැයි මට සිතෙයි.

-කෙෂි..... ඔයාගෙ තාත්තා කළේ මහා භයානක වැඩක්....." අශේන් දුරකථනයෙන් කීවේ ය.

මම නිහඬව අසා සිටියෙමි.

-අපේ තාත්තලා ගැන ඔයා දන්නෙ නැහැ...". අශේන් නැවත කීවේ ය. "......මේ දේවල් එයා තනියම කළ දේවල් නෙවෙයි.... එයා පිටිපස්සෙ තවත් බලගතු මිනිස්සු ඉන්නවා.... මේ මිනිස්සු හොඳ අය නෙවෙයි කෙෂි...." ඔහු කියාගෙන යයි. පිළිතුරක් ලෙස යමක් නොකියා ම මම අසා සිටියෙමි.

-...අපේ තාත්තාට ඇමති කම නැති උණා ට ඒ අය තවම බලවත්.... මං ලොකු කමකට කියනවා නෙවෙයි කෙෂි... ඒ අයට කරන්න බැරි වැඩක් නැහැ..... කෙෂි ඔයාගෙ තාත්තාට කතා කරන්න.... කියන්න පරිස්සම් වෙන්න කියලා..... මම හුඟක් දේ දන්න නිසයි මෙහෙම කියන්නෙ..."

-ඔයාට මොනවා හරි දැනගන්න ලැබුණ ද..?"

මම ඇසුවෙමි.

-තාත්තා මට කතා කළා.... එයා හුඟක් කේන්තියෙන් ඉන්නෙ... මට තේරෙනවා මොකක් හරි දෙයක් කරන්න ඒ අය හිතන බව.."

අශේන් නිවැරදි බව තහවුරු වන්නට දින දෙකක් වත් ගියේ නැත. නවීන පන්නයේ මෝටර් රියකින් ආ පිරිසක් විසින් තාත්තාගේ කාර්යාලයට වෙඩි තබනු ලැබූ පුවත මම සිරිසේන මාමා වෙතින් ලබා ගත්තෙමි.

-ඔෆිස් එකේ වැඩ කළ සමන් කියන මහත්තයා ට යි ඒ වෙලාවෙ වැඩක් කර ගන්න ඇවිත් හිටිය මනුස්සයෙකුටයි වෙඩි වැදිලා ඉස්පිරිතාලෙ ගෙනිච්චා... සමන් මහත්තයාගෙ තත්වෙ එච්චර හොඳ නැහැ... එයාට හුඟක් අමාරුයි... වාසනාවට මහත්තයා ඔෆිස්

24 පිටට